# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1975/68 - 2016 ජූලි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2016.07.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක - 39

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20(5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයෙකු, ආනයනකරුවකු, අසුරන්නකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් පහත දක්වා ඇති භාණ්ඩ එහි සඳහන් කර ඇති උපරිම සිල්ලර මිලට වඩා වැඩියෙන් වෙළෙඳාම් කිරීම, වෙළෙඳාම කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළෙඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| *නිෂ්පාදනය* | *උපරිම සිල්ලර මිල (රු. ශත)* |
|---|---|
| මයිසූර් පරිප්පු | කි.ග්‍රෑම් 1 රු. 169/- |
| වියළි හාල්මැස්සන් (ආනයනික - තායිලන්ත) | කි.ග්‍රෑම් 1 රු. 495/- |
| වියළි හාල්මැස්සන් (ආනයනික - ඩුබායි) | කි.ග්‍රෑම් 1 රු. 410/- |
| කඩල | කි.ග්‍රෑම් 1 රු. 260/- |
| මුං ඇට | කි.ග්‍රෑම් 1 රු. 220/- |
| ටින් කළ මාළු (ආනයනික) | ග්‍රෑම් 425 ක ශුද්ධ බර රු. 140/-<br>ග්‍රෑම් 280 ක දියර රහිත බර<br>ග්‍රෑම් 155 ශුද්ධ බර රු. 70/-<br>ග්‍රෑම් 105 ක දියර රහිත බර |
| සුදු සීනි | කි.ග්‍රෑම් 1 රු. 95/- |
| තිරිඟු පිටි | කි.ග්‍රෑම් 1 රු. 87/- |
| සම්පූර්ණ යොදය සහිත කිරිපිටි<br>ආනයනික<br>ග්‍රෑම් 400<br>කි. ග්‍රෑම් 1 | <br><br>රු. 325/-<br>රු. 810/- |

| *නිෂ්පාදනය* | *උපරිම සිල්ලර මිල (රු. ශත)* |
|---|---|
| දේශීය<br>ග්‍රෑම් 400<br>කි. ග්‍රෑම් 1 | <br>රු. 295/-<br>රු. 735/- |
| අධි ශීතකළ හෝ ශීතකළ කුකුළු මස් (සම්පූර්ණ කුකුළා)<br>සම සහිත<br>සම රහිත | <br>කි.ග්‍රෑම් 1 රු. 410/-<br>කි.ග්‍රෑම් 1 රු. 495/- |
| අර්තාපල් (ආනයනික) | කි.ග්‍රෑම් 1 රු. 120/- |
| බී ළූණු (ආනයනික) | කි.ග්‍රෑම් 1 රු. 78/- |
| වියළි මිරිස් (කුඩු නොකළ හෝ නො ඇඹරූ) | කි.ග්‍රෑම් 1 රු. 385/- |
| කරවල - කට්ටා | කි.ග්‍රෑම් 1 රු. 1,100/- |
| කරවල - සාලයා | කි.ග්‍රෑම් 1 රු. 425/- |
| සස්ටජන් ග්‍රෑම් 400 | රු. 1,500/- |
| උම්බලකඩ | කි.ග්‍රෑම් 1 රු. 1,500/- |

තවද, පහත සඳහන් භාණ්ඩ ඇසුරුම්/බහාලුම් වල අසුරා ඇත්නම් එම ඇසුරුම් කළ භාණ්ඩ සඳහා භාණ්ඩයේ බර නොසලකා අතිරේකව රු.5/- කට නොවැඩි මුදලක් එකතු කළ හැකි බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් නියම කරනු ලැබේ. එම භාණ්ඩ නම්, මයිසූර් පරිප්පු, වියළි හාල්මැස්සන් (ආනයනික - තායිලන්තය), වියළි හාල්මැස්සන් (ආනයනික - ඩුබායි), කඩල, මුං ඇට, සුදු සීනි, තිරිඟු පිටි, වියළි මිරිස්, කරවල - කට්ටා, කරවල - සාලයා සහ උම්බලකඩ වේ.

මෙම නියෝගය 2016 ජූලි මස 14 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පිළිවෙලින් 2014 අප්‍රේල් මස 22 වැනි දින, 2014 අගෝස්තු මස 01 වැනි දින, 2015 මාර්තු මස 19 වැනි දින, 2015 ජූලි මස 27 වැනි දින, 2015 නොවැම්බර් මස 24 වැනි දින හා 2015 දෙසැම්බර් මස 10 වැනි දින නිකුත් කළ *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 1812/24 හි නියෝග අංක 27, *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 1873/42 හි නියෝග අංක 29, *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 1906/47 හි නියෝග අංක 32, *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 1925/3 හි නියෝග අංක 34 හා *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 1944/47 හි නියෝග අංක 36 හා නියෝග අංක 37 දරන නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණපරිදි,

හසිත තිලකරත්න,
සභාපති.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.